දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 ප්‍රථම වර පරීක්ෂණය - 2017 අප්‍රේල්
Bachelor of Arts General (External) Degree Part I Regular Examination 2014 - April 2017

## භූවිසා 2.1 - සම්පත් සංවර්ධනය හා සැලසුම්කරණය
## GYG 2.1 - Resource Development and Planning

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. "සම්පත්" යන්න අර්ථ දක්වා, රටක සම්පත් ව්‍යාප්ති විෂමතාව හේතු කොට ගෙන පැන නැගිය හැකි ගැටලු 5 ක් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

02. සම්පතක් වශයෙන් "මිනිසා" සතුව පවත්නා සුවිශේෂී විභවතා නිදසුන් සහිත ව විග්‍රහ කරන්න.
(ලකුණු 20)

03. "ගෝලීයකරණ ක්‍රියාවලිය, සම්පත් උපයෝජන හැකියා පුළුල් කරයි" මෙම ප්‍රකාශය අර්ථවත් වන කරුණු 5 ක් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

04. දරිද්‍රතාව හා සම්පත් අතර ඇති සබඳතාව සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇසුරින් විමසන්න.
(ලකුණු 20)

05. I. ගෝලීය ව ව්‍යාප්ත ව ඇති වනාන්තර වර්ග පෙන්වා දී, වන හායනය හා වන විනාශය අර්ථ දක්වන්න.
(ලකුණු 06)

II. ආසියාතික කලාපයේ රටවල දක්නට ලැබෙන අධික ජනගහනය වන සම්පත් කෙරෙහි දක්වන බලපෑම විග්‍රහ කරන්න.
(ලකුණු 14)

06. තිරසර සංවර්ධන සංකල්පය (Sustainable Development) හඳුන්වා, සංවර්ධනය වෙමින් පවතින රටවල් මෙම සංකල්පය මුදුන් පමුණුවා ගැනීමේ දී මුහුණ දෙන බාධාවන්, ගැටළු සහ ඒ සඳහා අවශ්‍ය වන උපාය මාර්ග මොනවාදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

07. I. සම්පත් සංරක්ෂණය යනු කුමක්දැයි හඳුන්වා ඒ තුළ අඩංගු ප්‍රධාන අරමුණු පැහැදිලි කරන්න.

(ලකුණු 08)

II. ගෝලීය අර්බුදයකට තුඩු දී තිබෙන ජල සම්පත සංරක්ෂණය හා කළමණාකරණයට දියුණු වෙමින් පවතින රටවල් මුහුණ දිය යුත්තේ කෙසේද යන්න විග්‍රහ කරන්න.

(ලකුණු 12)

08. දකුණු ආසියාතික රටක් වශයෙන්, ශ්‍රී ලංකාවේ වර්ධනය වන ජනගහනය ස්වාභාවික සම්පත් කෙරෙහි ඇතිකර තිබෙන බලපෑම නිශ්චිත දත්ත හා තොරතුරු ඇසුරෙන් පැහැදිලි කරන්න. වනාන්තර, ජලය සහ භූමිය යන සම්පත්වලින් දෙකක් තෝරා ගෙන මෙය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)